අ.පො.ස . සා.පෙළ විභාගය 2026

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

# චිත්‍ර කලාව පෙරහුරු ප්‍රශ්න පත්‍රය

විභාග අංකය.................................... **චිත්‍ර කලාව - I** කාලය පැය එකයි

- **පහත රූපය ඇසුරු කරමින් අංක 01-05 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**



01. මෙම නිර්මාණය .............................................................................................කැටයම නමින් හැඳින්වේ.

02. දේවානම්පියතිස්ස රජු විසින් ඉදි කරවන ලද ...............................................විහාරයේ මෙය දක්නට ඇත.

03. මෙම කැටයම ...........................................................................................උන්නතව නෙළන ලද කැටයමකි.

04. කැටයමෙහි දකුණු පසින් දැත් බැඳගෙන සිටින රුවෙන් ..........................................................දැක්වෙතැයි පරණවිතාන ශූරීන් අදහස් කරයි.

05. කැටයමේ සෑම රූපයකම මුහුණේ හා ශරීරයේ ඉරියව්වලින්....................................................ලක්ෂණ ප්‍රකාශිත වේ.

Past Papers Wiki

- **අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

**06.** විසිවැනි සියවස අග කාටුන් ශිල්පීන් අතර වඩාත් ජනප්‍රියත්වයට පත් කාටුන් ශිල්පියා කවුද?

..........................................................................................................................................

**07.** එච්.ඒ. කරුණාරත්න ශිල්පියා විසින් එකලස් කිරීමේ ශිල්පක්‍රමය අනුව කරන ලද නිර්මාණය හැඳින්වෙනනේ කුමන නමකින් ද?

..........................................................................................................................................

**08.** ලාක්ෂා කර්මාන්තය වර්තමානයේ ක්‍රියාකාරිව පවත්වාගෙන යන ප්‍රදේශය කුමක් ද?

..........................................................................................................................................

**09.** අජන්තා චිත්‍ර අතර අංක 1 ලෙනෙහි ඇති විශිෂ්ට චිත්‍රය හඳුන්වන නම කුමක් ද?

..........................................................................................................................................

**10.** කාන්තාවන් හතරදෙනෙකු ගේ රූ දෝලාවක හැඩයට සම්පිණ්ඩනය කර නිර්මාණය කරන ලද සැරසිල්ල කුමන නමකින් හැඳින්වේ ද?.

..........................................................................................................................................

|

- **11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**11.** කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති තොලුවිල පිළිමය,

(1) ක්‍රිස්තු වර්ෂ 4-5 වන සියවසට පමන අයත් සේ සැලකේ.
(2) පල්ලව සම්ප්‍රදායේ කලා ලක්ෂණ අනුව නෙළා ඇත.
(3) ඒකාංශ කොට පෙරවූ චීවරය රැලි සහිත ඇඟට ඇලුන ස්වභාවයක් නිරූපිත ය.
(4) ධ්‍යාන මුද්‍රාවෙන් හා වීරාසන ක්‍රමයෙන් යුක්ත ය.

**12** පළමු පරාක්‍රමබාහු රජු විසින් ඉදිකරවන ලද තිවංක පිළිමගෙය තුළ දක්නට ලැබෙන චිත්‍ර

(1) තෙත බදාමය මත අඳින ලද සිතුවම් වේ.
(2) පොළොන්නරු යුගයේ චිත්‍ර කලාවේ ලක්ෂණ පෙන්වයි.
(3) හින්දු ආගමික බලපෑම්වලට ලක්වී ඇත.
(4) අනුරාධපුර හා මහනුවර චිත්‍ර කලාවන්වල ලක්ෂණ පෙන්වයි.

**13** තල්කොල පැදුරු වර්ග අතර ''පන්දිප්පායි'' යනුවෙන් හඳුන්වන්නේ කුමන පැදුරු වර්ගයක් ද?

(1) උත්සව පැදුරු (2) අස්වනු පැදුරු .(3)බත් පැදුරු (4) පාට පැදුරු

**14** පෝස්ටර් චිත්‍රයක තිබිය යුතු විශේෂ ලක්ෂණයක් නොවන්නේ,

(1) සංකේතාත්මක සරල හැඩතල භාවිතය. (3)අක්ෂර භාවිතයෙන් පණිවිඩය තීව්‍ර කළ හැකි වීම.
(2) සංගත වර්ණ බහුලව යොදා ගැනීම. (4)අදහස නිරූපණය සඳහා වර්ණ උපයෝගී කර ගැනීම.

**15** ලැම්බුත් නැමති මූර්තිය තුළින් නිරූපණය වන්නේ,

(1) සම්භාව්‍ය යුගයේ කලා ලක්ෂණයි. (3) හෙලනිස්තික් යුගයේ කලා ලක්ෂණයි.
(2) ග්‍රීක යතාර්ථවාදී සම්ප්‍රදායේ ලක්ෂණයි. (4) ග්‍රීක කලා කෘතිවල මූලික ලක්ෂණයි.

- **අංක 16 සිට 20 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලිවන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න**

16 මිනරෙට් :..........................................................................................................

17 බොරදම් :..........................................................................................................

18 අල්ලියාදු :..........................................................................................................

19 මොනෝක්‍රෝම් :..........................................................................................................

20 ත්‍රිභංග :..........................................................................................................

- අංක 21 සිට 25 තෙක් දී ඇති රූපසටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියෙන් ඇති A,B,C,D සහ E යන ඒවා අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

21.  (..............)  A

22.  (..............)  B

23.  (..............)  C

24  (..............)  D

25.  (..............)  E

- අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය /වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

26. නටරාජා මූර්තියේ වම් පාදයෙන් පාගාගෙන සිටින වාමන රුවෙන් ..............................සංකේතවත් කරයි.

27. ඩේවිට් පේන්ටර් ශිල්පියා විසින් ක්‍රිස්තු චරිතය තේමා කරගනිමින් ....................................දෙව් මැදුර තුළ සිතුවම් රැසක් නිර්මාණය කර ඇත.

28. තිස්ස රණසිංහ ශිල්පියා ගේ නිර්මාණයක් වන කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහලේ ඇති උන්නත නිර්මාණය ..............................................................මාධ්‍ය භාවිතයෙන් නිම කර ඇත.

29. මහනුවර යුගයේ පහතරට සිතුවම් හී නිරූපිත ඇඳුම් පැළඳුම් හා ගෘහ අලංකරණ හේතුවෙන් එම සිතුවම් සඳහා ..................................................................ලක්ෂණ බහුලව බලපා ඇති බව පෙනේ.

30. පරණවිතාන මහතාගේ මතය වන්නේ සීගිරි සිතුවම්වලින් නිරූපණය වන කාන්තාවන්ගෙන් ..........................................................................සංකේතවත් වන බවයි.

PAST PAPERS WIKI

Past Papers Wiki

- අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට **F,G,H,I,J** යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



F



G



H



I



J

31. F අක්ෂරයෙන් දැක්වෙන සුන්දරමූර්තිස්වාමි නමැති ශිව භක්තිකයා මූර්තිය නිමවා ඇති මාධ්‍යය කුමක්ද?

.......................................................................................................................

32. G අක්ෂරයෙන් දැක්වෙන කුකුල් පොරය නම් සිතුවම නිර්මාණය කරන ලද ශිල්පියා කවුද?

.......................................................................................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන කවන්ද මිනිස් රුව මූර්තිය කුමන ප්‍රදේශයකින් හමු වූවක් ද?

.......................................................................................................................

34. I අක්ෂරයෙන් දැක්වෙන නාරජ රූපය සහිත මුරගල අයත්වන යුගය කුමක් ද?

.......................................................................................................................

35. J අක්ෂරයෙන් දැක්වෙන සිතුවමෙහි තේමාව කුමක් ද?

.......................................................................................................................

- **ඔබ වෙත සපයා ඇති චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාලව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.(තනි වචනයෙන් සපයන පිළිතුරු සඳහා ලකුණු නොලැබේ)**

36. ස්ථානය හා ශිල්පියා :.......................................................................................

.......................................................................................

37 තේමාව :.......................................................................................

.......................................................................................

38. රේඛා හා වර්ණ භාවිත:.......................................................................................

.......................................................................................

39. සංරචනය :.......................................................................................

.......................................................................................

40. භාව ප්‍රකාශනය :.......................................................................................

.......................................................................................

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලුම හිමිකම් ඇවිරිණි All Rights Reseved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 S I

පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය

# චිත්‍ර කලාව - I

- ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සිතුවම භාවිත කරන්න



PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library